අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General
Tel. 2484614
Fax. 2436337

කාර්යාලය
அலுவலகம்
Office
Tel. 2484637
Fax. 2431458

Website: www.treasury.gov.lk


# රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
அரச நிதித் திணைக்களம்
பொதுத் திறைசேரி
**DEPARTMENT OF PUBLIC FINANCE**
General Treasury


මහලේකම් කාර්යාලය (1වෙනි මහල)
செயலகம் (1ம் மாடி)
The Secretariat (1st Floor)

කොළඹ-01
கொழும்பு-01
Colombo-01

E-mail: pubfin@pfd.treasury.gov.lk


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | PF/PD/02/Cir 2010 (i) | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2010.04.30 | | |

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 442

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු සමාගම්වල
සහ අධිකාරිවල සභාපතිවරුන් වෙත,

<u>**දේශීය අරමුදල් යටතේ කොන්ත්‍රාත් වැඩ සඳහා සහභාගීවන දේශීය ලංසුකරුවන් වෙත ප්‍රමුඛතාවය ලබාදීම**</u>

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" මගපෙන්වීමට අනුව ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී දේශීය ඉදිකිරීම් කර්මාන්තය සහ අනෙකුත් සමාන කර්මාන්තයන්හි උපරිම හැකියාවන් දායක කර ගැනීම පිණිස එම කර්මාන්ත නැංවීම සඳහා රජයේ වැඩ කොන්ත්‍රාත් පැවරීමේදී ප්‍රමුඛත්වය ලබා දීමට රජය විසින් එකඟත්වය පළකර තිබේ. ඉදිකිරීම් කර්මාන්තයෙහි ජාතික වැදගත්කම හඳුනාගනිමින් දේශීය අගය නැංවීමේ ක්‍රියාවලියෙහි සුවිශාල වූ වාසි සැලකිල්ලට ගෙන දේශීය කොන්ත්‍රාත්කරුවන් විදේශීය පිරිනැමුම්කරුවන් සමග තරඟකිරීමේදී ලබාදෙන දේශීය ප්‍රමුඛත්වය සියයට දහයේ (10%) සිට සියයට පහළොව (15%) දක්වා ඉහළ දැමීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබේ. ඒ අනුව සියලුම ටෙන්ඩර් මෙම පදනම මත ඇගයීම් කළ යුතුය.

02. ඒ අනුව 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති 7.9.5 සංශෝධනය කරනු ලැබේ. කෙසේ නමුත් 7.9.5 යටතේ ඇති අනෙකුත් කොන්දේසි සහ නියමයන් නොවෙනස්ව පවතී.

03. සංශෝධිත ප්‍රමුඛතාව මෙම චක්‍රලේඛ දිනයෙහි සිට ක්‍රියාත්මක වන ටෙන්ඩර් සඳහා අදාළ වේ.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්